# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2028/34 - 2017 ජූලි මස 19 වැනි බදාදා - 2017.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 (1) වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින්, (2016 දෙසැම්බර් මස 01 වැනි දින අංක 1995/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එහි 21 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2009 මැයි මස 28 වැනි දින අංක 1603/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* සහ 2011 ජූනි මස 24 වැනි දින අංක 1711/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ "පීඨය" යන ශීර්ෂය යටතේ දැක්වෙන "මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ "අධ්‍යයන අංශය" යන ශීර්ෂය යටතේ දැක්වෙන සටහන් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| " *I වන තීරය* *පීඨය* | *II වන තීරය* *අධ්‍යයන අංශය* |
|---|---|
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය |
| | 3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයන අංශය |
| | 5. ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයන අංශය |
| | 6. පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය |
| | 7. භාෂා හා සංස්කෘතික අධ්‍යයන අංශය |
| | 8. ඉංග්‍රීසි හා වාග්විද්‍යා අධ්‍යයන අංශය |
| | 9. දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය |
| | 10. අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයන අංශය |
| | 11. සමාජ විද්‍යා අධ්‍යයන අංශය |
| | 12. මානව විද්‍යා අධ්‍යයන අංශය" |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජූලි මස 14 වැනි දින,
කොළඹ දී ය.

08 - 143

1A - PG 3616 — 508 (2017/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*